**උතුරු පළාතේ තිරසර ධීවර සංවර්ධනය සඳහා ව්‍යාපෘති සැලසුම්කරණ අත්තිකාරම් සඳහා වන ව්‍යාපෘතිය - 2020**

---

උතුරු පළාතේ තිරසර ධීවර සංවර්ධනය සඳහා ව්‍යාපෘති සැලසුම්කරණ අත්තිකාරම් සඳහා වන ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව 2017 මාර්තු 17 දින එළඹි අංක පීඩීඒ 6011 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 1V ව්‍යවස්ථාවේ 4.04 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

---

ණය ගිවිසුම අනුව, ධීවර අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති ක්‍රියාත්මකකිරීමේ හා අධීක්ෂණයකිරීමේ ඒකකය ව්‍යාපෘතියේ ක්‍රියාත්මකකිරීමේ නියෝජිතායතනය වේ. ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් තිරසර උපයෝජනය සඳහා ධීවර වරාය, නැංගුරම් ස්ථාන හා ගොඩබෑම් ස්ථාන පිළිබඳ විස්තරාත්මක සැලැස්මක් සිදු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 267.79 කට සමාන වූ එජඩො මිලියන 1.59 **ක්** වන අතර ඉන් රු. මිලියන 218.95 කට සමාන වූ එජඩො මිලියන 1.3 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 48.84 කට සමාන වූ එජඩො මිලියන 0.29ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2017 මාර්තු 20 දින ආරම්භ කරන ලද අතර, 2018 ජුනි 01 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපාතිය අවසන් කරන දිනය 2020 මැයි 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | | රු.මිලියන | | |
| (අ) | මුළු ගෙවීම්වලට අදාළ වවුචර 2021 සැප්තැම්බර් 30 දින දක්වා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 6.42 | ප්‍රතිචාර දක්වා නැත | ගෙවීම්වලට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | රේඛීය අමාත්‍යාංශය සහ ව්‍යාපෘතිය මගින් පවත්වාගෙන යනු ලබන වාර්තා අතර සමාලෝචිත වර්ෂය තුළ විදේශ ණය සඳහා දරන ලද වියදම්වල වෙනසක් තිබුණි. වෙනසට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 24.35 | ප්‍රතිචාර දක්වා නැත | භාණ්ඩාගාර වාර්තා සමඟ ලෙජර් ශේෂයන් සැසඳීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් වීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින දක්වා පේසාලේ ධීවර වරාය ඉදිකිරීම සඳහා උපදේශන සේවා සඳහා දරන ලද ආර්ථික නොවන වියදම් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | 18.6 | ප්‍රතිචාර දක්වා නැත | නැවත සැලසුම් කිරීමේ සාධාරණත්වය තීරණය කිරීම සඳහා වෙනස්කම් සඳහා හේතුව තවදුරටත් විමර්ශනය කළ යුතුය. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2020 ජනවාරි 10 දිනැති විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ තීරණය | පේදුරුතුඩුව ධීවර වරාය සම්බන්ධයෙන් මතුව ඇති ප්‍රජා විරෝධතා විසඳන තුරු සියලු ව්‍යාපෘති කටයුතු නවතා දැමීමට 2020 ජනවාරි 16 දින විදේශ සම්පත් දෙපාර්තමේන්තුව තීරණය කර තිබියදීත්, ඉහත වරාය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු ප්‍රසම්පාදනය කර ගැනීම සඳහා නැවත ලංසු කැඳවීමට 2020 පෙබරවාරි 6 දින තීරණය කිරීම මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන කමිටුව වෙත කරන ලද රු. 418,358 ක ගෙවීම මතභේදාත්මක විය. | ප්‍රතිචාර දක්වා නැත | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ තීරණය අනුව ක්‍රියා කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති ගිවිසුමේ පරිපාලන අත්පොතෙහි 16 ඡේදය | අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයේ විෂය පථයට ව්‍යාපෘතියේ විගණනය ඇතුළත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | ප්‍රතිචාර දක්වා නැත | අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයේ විෂය පථයට ව්‍යාපෘතියේ විගණනය ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති ගිවිසුමේ පරිපාලන අත්පොතෙහි 66 ඡේදය | ව්‍යාපෘති ගිවිසුමේ පරිපාලන අත්පොතෙහි 66 වැනි ඡේදයට අනුව, ව්‍යාපෘතිය භෞතික වශයෙන් අවසන් කර මාස හයක් ඇතුළත එම ව්‍යාපෘතිය නිම කිරීම පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශය ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු නමුත්, 2021 සැප්තැම්බර් 30 දින වන විට එවැනි වාර්තාවක් ඉදිරිපත් කළ බව විගණනයට දන්වා නොතිබුණි. | ප්‍රතිචාර දක්වා නැත | ව්‍යාපෘතිය භෞතිකව නිම කිරීමෙන් මාස හයක් ඇතුළත එම ව්‍යාපෘතිය අවසන් කිරීම පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශය විසින් ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘති අරමුණුවලින් බාහිර ක්‍රියාකාරකම්/ ගෙවීම්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යෝජිත ඉදිකිරීම් වැඩබිම් දෙකෙහි මහජන විරෝධතා නිසි ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් ව්‍යාපෘතියේ සැලසුම් සකස් කිරීම සඳහා වැය කළ රුපියල් මිලියන 220ක් ආර්ථික නොවන ගනුදෙනුවක් බවට පත්ව තිබුණි. | ප්‍රතිචාර දක්වා නැත | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ඉහත ස්ථාන දෙකෙහි ධීවර වරායන් ඉදිකිරීමට තීරණයක් ගැනීමේදී මහජන විරෝධය ද සලකා බැලිය යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය සඳහා 2019 දී රු. 741,582ක් වැය කර මිලදී ගත් කාර්යාල උපකරණවල දිනය සහ වටිනාකම ඇතුළත් වූ අයිතම ලැයිස්තුවක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. තවද, ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු එම කාර්යාල උපකරණ ධීවර අමාත්‍යාංශයට ලබාදීමට සැලසුම් කර තිබුණද 2021 ඔක්තෝබර් 05 වන දින වන විටත් එය අමාත්‍යාංශයට භාරදී නොතිබුණි. | ප්‍රතිචාර දක්වා නැත | ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් කාර්යාල උපකරණවල දිනය සහ වටිනාකම ඇතුළු අයිතම ලැයිස්තුවක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු අයිතම ධීවර අමාත්‍යාංශයට භාර දිය යුතුය. |

**3.2** **මතභේදාත්මක ගනුදෙනු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය 2017 මාර්තු 20 දින සිය මෙහෙයුම් ආරම්භ කර 2018 ජුනි 01 වන විට අවසන් කිරීමට නියමිතව තිබූ නමුත් ණය දෙන නියෝජිතායතනය කැබිනට් අනුමැතිය ලබා ගැනීමකින් තොරව ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනය 2020 මැයි 31 දක්වා දීර්ඝ කර තිබුණි. | ප්‍රතිචාර දක්වා නැත | වෙනස්කම්වලට හේතුව සොයා බලා නිවැරදිව වාර්තා කළ යුතු අතර පසුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සමන්විත වූයේ පේසාලේ සහ පේදුරුතුඩුව ධීවර වරායන් ඉදිකිරීම සැලසුම් කිරීමෙනි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් වීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින දක්වා රුපියල් මිලියන 18.6 ක මුදලක් සැලසුම් වැඩ සඳහා වැය කිරීමෙන් පසු පේසාලේ ධීවර වරාය සැලසුම් කිරීම 2019 දී ඉවත් කර ගන්නා ලදී. | ප්‍රතිචාර දක්වා නැත | නැවත සැලසුම් කිරීමේ සාධාරණත්වය තීරණය කිරීම සඳහා වෙනස්කම් සඳහා හේතුව තවදුරටත් විමර්ශනය කළ යුතුය. |